(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක **42.** ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2023 ජූලි 19** බදාදා **පූ.භා. 9.30** ට

## පැමිණි මන්ත්‍රීන් :

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

**ගරු අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

**ගරු අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

**ගරු ටිරාන් අලස් මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

**ගරු නසීර් අහමඩ් මහතා,** පරිසර අමාත්‍යතුමා

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

**ගරු ජීවන් තොන්ඩමන් මහතා,** ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

**ගරු ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

**ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

**ගරු කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

**ගරු සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

**ගරු ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඩයනා ගමගේ මහත්මිය,** සංචාරක රාජ්‍ය අමාත්‍යතුමිය

**ගරු සිරිපාල ගමලත් මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,** ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඩී. වී. චානක මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අනුරාධ ජයරත්න මහතා,** අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු චාමර සම්පත් දසනායක මහතා,** ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා,** ධීවර රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු රෝහණ දිසානායක මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු සනත් නිශාන්ත මහතා,** ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අනුප පස්කුවල් මහතා,** සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අශෝක ප්‍රියන්ත මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු විජිත බේරුගොඩ මහතා,** පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු කේ. කාදර් මස්තාන් මහතා,** ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ලොහාන් රත්වත්තේ මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු කනක හේරත් මහතා,** තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

---

**ගරු අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**

**ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

**ගරු කපිල අතුකෝරල මහතා**

**ගරු නීතිඥ තලතා අතුකෝරල මහත්මිය**

**ගරු සම්පත් අතුකෝරල මහතා**

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**

**ගරු වජිර අබේවර්ධන මහතා**

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු මායාදුන්න චින්තක අමල් මහතා

ගරු තවරාජා කලෙයි අරසන් මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු තිසකුට්ටි ආරච්චි මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු අකිල එල්ලාවල මහතා

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පායලී චම්පික රණවක මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

**ගරු සී. වී. වික්නේෂ්වරන් මහතා**

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා**

**ගරු නීතිඥ මධුර විතානගේ මහතා**

**ගරු හේෂා විතානගේ මහතා**

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**

**ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා**

**ගරු වීරසුමන වීරසිංහ මහතා**

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**ගරු ජගත් සමරවික්‍රම මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු නීතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු නීතිඥ රවූෆ් හකීම් මහතා**

**ගරු අබ්දුල් හලීම් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

**ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

1. **කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

I

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, 'ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි."

II

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා විසින් 2023 ජුනි 08 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය."

2. **ලිපිලේඛනාදිය පිළිගැන්වීම**: (1) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2023 ජූලි 17 දිනැති අංක 2341/03 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරමින් කරන ලද ප්‍රකාශනය ඉදිරිපත් කරන ලදී.

එම ලේඛන, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් —

(i) 2020 වර්ෂය සඳහා සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2021 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉදිරිපත් කර එම වාර්තා අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

දිවුලපිටිය, හොරගස්මුල්ල, රජමල් උයන, අංක 29/ඒ/101 දරන ස්ථානයෙහි පදිංචි අයි.ඩී. චාමින්ද මහතාගෙන් ලැබුණු 2023.05.03 දිනැති පෙත්සම ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ පෙත්සම, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබේ.

**4. දූෂණ විරෝධී පනත් කෙටුම්පත:**

පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය'' යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේ දී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 1 වැනි පිටුවේ 7 වැනි පේළියේ සිට 11 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''ලැබිය හැකි දිනයක සිට ක්‍රියාත්මකභාවයට පත් විය යුතු ය:'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 1 වැනි පිටුවේ 13 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''ක්‍රියාත්මක වන දිනයේ සිට මාස දහඅටකට නොවැඩි කාලයක දී ක්‍රියාත්මක:'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

2 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 3 වැනි පිටුවේ 11 වැනි පේළියේ සිට 15 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(2) මේ වගන්තියේ කාර්ය සඳහා ''පාලනය'' යන්නට, වගකිව යුතු බව, විනිවිදභාවය, ප්‍රතිචාරශීලීත්වය, නීතියේ ආධිපත්‍ය සහ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා නිර්මිත පද්ධති සහ ක්‍රියාමාර්ග ඇතුළත් වේ.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 3 වැනි පිටුවේ 31 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

''(4) කොමිෂන් සභාව විසින්, ස්වකීය බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී හෝ කිරීමේ දී කොමිෂන් සභාව සම්බන්ධයෙන් විධාන කිරීම හෝ අධීක්ෂණය කිරීම සඳහා නීතිය යටතේ හිමිකම් ලැබූ අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් හැර වෙනත් යම් තැනැත්තකු විසින් කරනු ලබන යම් විධානයකට හෝ වෙනත් මැදිහත්වීමකට යටත් වීමෙන් තොරව ස්වකීය බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ කිරීම කරනු ලැබිය යුතු ය.

(5) නෛතික අධිකාරී බලයකින් තොරව, මේ වගන්තියේ (4) වන උපවගන්තියේ සඳහන් පරිදි වූ කොමිෂන් සභාවේ බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හෝ කිරීමට මැදැහත් වන හෝ මැදිහත්වීමට තැත් කරන සෑම තැනැත්තකුම ජූරි සභාවක් නොමැතිව පවත්වනු ලබන නඩු විභාගයකින් පසු මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට එක් අවුරුද්දක් දක්වා දීර්ඝ විය හැකි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකෙන් ම දඬුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතු අතර, ඊට අමතරව-

(අ) එකී වරදකරු කරනු ලැබීමේ දින සිට අවුරුදු හතක් නොඉක්මවන කාලසීමාවක් සඳහා-

(i) ජනමත විචාරණයක දී;

(ii) ජනරජයේ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීමක දී;

(iii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීමක දී,

ඡන්දහිමියකු වීමට සහ ඡන්දය දීමට; හෝ

(ආ) රජයේ ධුරයක් දැරීමට හෝ රජයේ නිලධරයකු ලෙස සේවයේ නියුක්ත වීමට,

නුසුදුස්සකු විය යුතු ය.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

4 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 4 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 8 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"කොමිෂන් සභාවේ සංයුතිය

4. (1) කොමිෂන් සභාව, ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත පහත දැක්වෙන තැනැත්තන් අතුරින් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු ය:-

(අ) ප්‍රවීණ, විශිෂ්ටත්වයට පත් සහ නීතිය පිළිබඳ අවම වශයෙන් වසර විස්සක පළපුරුද්දක් සහිත තැනැත්තකු; සහ

(ආ) පහත සඳහන් ක්ෂේත්‍රයන් එකක් හෝ කිහිපයක් පිළිබඳ ප්‍රවීණ, විශිෂ්ටත්වයට පත් සහ අවම වශයෙන් අවුරුදු විස්සක පළපුරුද්දක් සහිත තැනැත්තන් දෙදෙනකු:-

(i) අපරාධ විමර්ශනය කිරීම සහ නීතිය ක්‍රියාත්මක කිරීම;";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 5 වැනි පිටුවේ 18 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(3) ජනාධිපතිවරයා විසින් ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත කොමිෂන් සභාවේ සාමාජිකයන්ගෙන්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

5 වැනි වගන්තිය සභා සම්මත විය.

6 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 6 වැනි පිටුවේ 18 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"මානසික හෝ වෙනත් නොහැකියාවක් හෝ මේ පනතේ 5 වන වගන්තිය යටතේ වන නුසුදුසුකමක් යන හේතු පිළිබඳව";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

7 වැනි වගන්තිය සභා සම්මත විය.

8 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 8 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 4 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''(2) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් එකී සාමාජිකයාගේ ධුර කාලය අවසන් වීම හේතුවෙන් ඇති වූ විට ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් මාස තුනක කාලයක් ඇතුළත නව සාමාජිකයකු පත් කරනු ලබන තෙක් එකී සාමාජිකයා සිය ධුරයේ කටයුතු කරනු ලැබිය යුතු ය.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

9 වැනි වගන්තියේ සිට 12 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

13 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 9 වැනි පිටුවේ 8 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''13. කොමිෂන් සභාව විසින්, මේ පනතේ විධිවිධාන'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

14 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 9 වැනි පිටුවේ 22 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''සාමාජිකයන් තිදෙනෙකු විය යුතු අතර නොඑකඟතාවක් ඇති වූ විට, බහුතර තීරණය බල පවත්වනු ලැබිය යුතු ය'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

15 වැනි වගන්තිය සභා සම්මත විය.

16 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 10 වැනි පිටුවේ 18 වැනි පේළියේ සිට 23 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

17 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 10 වැනි පිටුවේ 27 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "මත සහ කොමිෂන් සභාවේ සාමාජිකයන් විමසීමෙන් පසු මේ පනත යටතේ පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

18 වැනි වගන්තිය සභා සම්මත විය.

19 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 12 වැනි පිටුවේ 3 වැනි පේළිය සහ 4 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "(ඇ) අපරාධ නඩු කටයුතු මෙහෙයවීමේ අවම වශයෙන් වසර පහළොවක පළපුරුද්ද සහිත නීතිඥවරයකු විය යුතු ය;";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

20 වැනි වගන්තිය සභා සම්මත විය.

21 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 13 වැනි පිටුවේ 28 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාව විමසමින් මේ පනතේ 19 වන වගන්තියේ (2) වන උපවගන්තියේ දක්වා ඇති නුසුදුසුකම්වලින් හේතු එකක් හෝ කිහිපයක් මත හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හැසිරීම කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් නිෂේධනාත්මකව බලපාන විට ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

22 වැනි වගන්තිය සභා සම්මත විය.

23 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 14 වැනි පිටුවේ 14 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

> ''(3) ජනාධිපතිවරයා විසින් ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත එම ධුර කාලය අවසන් වීමේ සිට මාස තුනක් ඇතුළත නව අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කරනු ලැබිය යුතු ය.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

24 වැනි සහ 25 වැනි වගන්ති සභා සම්මත විය.

26 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 17 වැනි පිටුවේ 6 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''රාජ්‍ය විගණන සේවයේ යම් සාමාජිකයකු එම සාමාජිකයාගේ සහ විගණන සේවා කොමිෂන් සභාවේ''; සහ

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 17 වැනි පිටුවේ 10 වැනි පේළියේ සිට 12 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''නැතහොත් කොමිෂන් සභාව විසින් සහ විගණන සේවා කොමිෂන් සභාව විසින් එකඟ විය හැකි විශ්‍රාම වැටුප් හෝ'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

27 වැනි වගන්තියේ සිට 30 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

31 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 20 වැනි පිටුවේ 13 වැනි පේළියේ සිට 21 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව සහ (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, යම් වරදක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් පවත්වන ලද පරීක්ෂණ, විමර්ශන සහ අපරාධ නඩු කටයුතු සඳහා වන සියලු වියදම් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු ය."; සහ

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 21 වැනි පිටුවේ 13 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"(6) (4) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ යම් මුදල්, පරිත්‍යාග, ත්‍යාග, රික්තාවරණ හෝ ප්‍රදාන වශයෙන් ලැබුණු විට, එම පරිත්‍යාගය, ත්‍යාගය, රික්තිවරණය හෝ ප්‍රදානය ලබා දුන් මූලාශ්‍රය සහ අරමුණ එම ලැබීමේ දින සිට මසක් ඇතුළත ජනතාවට දැනගැනීමට සැලැස්විය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

32 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 21 වැනි පිටුවේ 17 වැනි පේළිය සහ 18 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"සේවානියුක්තයන්ගේ පත්වීම්, උසස් වීම්, ඔවුන් විෂයෙහි විනය පාලනය සහ සේවයෙන් පහකිරීම කොමිෂන් සභාව සතු විය යුතු මෙන්ම තත්කාර්ය සඳහා";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 21 වැනි පිටුවේ 23 වැනි පේළිය සහ 24 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"වීම්, පාරිශ්‍රමික, විනය පාලනය, සේවයෙන් පහ කිරීම, චර්යාව සහ නිවාඩු ප්‍රදානය කිරීම ඇතුළුව ඔවුන් සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය යුතු ය."; සහ

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 21 වැනි පිටුවේ 25 වැනි පේළියේ සිට 29 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 21 වැනි පිටුවේ 29 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

" '(4) කොමිෂන් සභාවේ සේවා නියුක්තිකයෙකුගේ සේවය අවසන් කළ විටකදී එම සේවා නියුක්තිකයා හට කාර්මික ආරවුල් පනත යටතේ කම්කරු විනිශ්චය සභාව වෙත අයැදුම්පතක් ඉදිරිපත් කළ හැක.' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 21 වැනි පිටුවේ 23 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" 'වීම්, පාරිශ්‍රමික, විනය පාලනය, දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ කාර්ය පරිපාටිය, චර්යාව සහ නිවාඩු ප්‍රදානය කිරීම' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

33 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 22 වැනි පිටුවේ 3 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"කරනු ලැබිය යුතු අතර එම කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් මේ පනත යටතේ මධ්‍යම අධිකාරිය වශයෙන් බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම සහ කර්තව්‍ය කිරීම සිදු කරනු ලැබිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

34 වැනි වගන්තියේ සිට 38 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

39 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 23 වැනි පිටුවේ 1 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"39. (1) කොමිෂන් සභාව විසින් දූෂණය අවම කිරීම සඳහා අවශ්‍ය"; සහ

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 23 වැනි පිටුවේ 4 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"(2) කොමිෂන් සභාව විසින්, දූෂණය වැළැක්වීමේ දී සහ දූෂණයට එරෙහිව සටන් කිරීමේ දී දූෂණයේ පැවැත්ම, ඊට හේතු සහ එහි බැරෑරුම් බව සහ දූෂණය මඟින් එල්ල වන තර්ජන සම්බන්ධයෙන් වන මහජන දැනුවත්භාවය ඉහළ නැංවීමට සිවිල් සමාජය, රාජ්‍ය නොවන සහ ප්‍රජා පාදක සංවිධානවල ක්‍රියාකාරී සහභාගීත්වය ප්‍රවර්ධනය කළ යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

40 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 24 වැනි පිටුවේ 1 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(උ) අල්ලස් සහ දූෂණය වැළැක්වීම සහ තුරන් කිරීම සඳහා යහපත් වාණිජ පරිචයන් ප්‍රවර්ධන කිරීම පිණිස යහපත්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 24 වැනි පිටුවේ 4 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"(ඌ) රාජ්‍ය අංශයේ අල්ලස් සහ දූෂණය වැළැක්වීම සහ තුරන් කිරීම සඳහා රාජ්‍ය පරිපාලනයේ දී දැඩිව අනුගමනය කළ යුතු චර්යා සංග්‍රහයන් හඳුන්වා දීම;"; සහ

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 24 වැනි පිටුවේ 8 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"(ඕ) කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි අභ්‍යාසලාභීන් සහ පුහුණුවන්නන් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි සේවා කොන්දේසිවලට අනුව බඳවා ගැනීම,";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

41 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 24 වැනි පිටුවේ 16 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"වරදක් හැර, මේ පනතේ II වන කොටස සහ III වන කොටසේ I වන පරිච්ඡේදය සහ II වන පරිච්ඡේදය යටතේ වූ යම් වරදක්;"; සහ

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 24 වැනි පිටුවේ 24 වැනි පේළියේ සිට 28 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"විටෙක, එවැනි යම් වරදක්; හෝ

(ඈ) එම වරද මේ පනත ප්‍රකාරව වූ වරදක් සම්බන්ධයෙන්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 24 වැනි පිටුවේ 10 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" '41 (1) කොමිෂන් සභාව විසින්, මේ පනතේ විධිවිධාන යටතේ' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 25 වැනි පිටුවේ 7 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

" '(2) 43 වගන්තිය යටතේ පැමිණිල්ලක් සිදුකොට ඇති යම් පුද්ගලයෙකු විසින් ඒ උදෙසා ඉල්ලීමක් කරනු ලැබුවහොත්, කොමිෂන් සභාව විසින් එම පුද්ගලයා වෙත යම් ලිපි ගොනුවක් වසා දැමීම සම්බන්ධයෙන් සවිස්තරාත්මක සාධාරණීකරණයක් ලබාදිය යුතුය.' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

42 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 25 වැනි පිටුවේ 18 වැනි පේළියේ සිට 22 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ඇත්තේ ද යන්න විශ්වාස කිරීම සඳහා සාධාරණ හේතු පවතී ද යන්න නිශ්චය කිරීම, මූලික පරීක්ෂණයක් පැවැත්වීමේ අදහස වන්නේ ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 25 වැනි පිටුවේ 23 වැනි පේළියේ සිට 26 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(3) මූලික පරීක්ෂණයක් සිදු කිරීමෙන් පසුව, 41 වන වගන්තිය යටතේ සඳහන් වරදක් සිදු කොට ඇති බවට කොමිෂන් සභාව"; සහ

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 26 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 7 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"එසේ වුව ද, 41 වන වගන්තියේ සඳහන් වරදක් සිදු කර ඇති බව විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින බවට කොමිෂන් සභාව සෑහීමට පත් වේ නම්, මූලික පරීක්ෂණයක් පැවැත්වීමෙන් තොරව විමර්ශනයක් පවත්වන ලෙස කොමිෂන් සභාව විසින් බලය පවරනු ලැබිය හැකි ය."; සහ

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 27 වැනි පිටුවේ 27 වැනි පේළියේ සිට 33 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 29 වැනි පිටුවේ 4 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "සභාව විසින් ලිඛිතව සටහන් කළ යුතු අතර පැමිණිල්ල සිදු කළ තැනැත්තාට එය සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

43 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 29 වැනි පිටුවේ 27 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "යටතේ යම් වරදක් සිදුව තිබිය හැකි හෝ සිදු";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 29 වැනි පිටුවේ 27 වැනි පේළිය සහ 28 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> " 'යටතේ යම් අල්ලස් හෝ දූෂණ ක්‍රියාවක් සිදුව තිබිය හැකි හෝ සිදු කරනු ලැබ ඇතැයි සැක කරනු ලැබිය හැකි හෝ සිදු කිරීමේ හැකියාවක් ඇති බව එකී මතය වන' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

44 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 30 වැනි පිටුවේ 2 වැනි පේළියේ සිට 7 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "ලබන යම් තැනැත්තකු වෙත විමර්ශනයේ ප්‍රගතිය අඩාල නොවන පරිදි 42 වන වගන්තිය යටතේ පවත්වන ලද විමර්ශනයට අදාළව ගනු ලැබූ මූලික පියවර සපයනු ලැබිය යුතු ය."; සහ

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 30 වැනි පිටුවේ 12 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

> " (3) 43 වන වගන්තිය යටතේ පැමිණිල්ලක් කරන ලද යම් තැනැත්තකු වෙත එම තැනැත්තා විසින් ඒ වෙනුවෙන් කරන ලද ඉල්ලීමක් මත ලිපි ගොනුවක් වසා දැමීම සම්බන්ධව විස්තරාත්මක යුක්තිසාධනයක් ලබා දිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 30 වැනි පිටුවේ 5 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> " 'සපයනු ලැබිය යුතුය. කොමිෂන් සභාව විසින් විමර්ශනයට අදාළව' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

45 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 31 වැනි පිටුවේ 29 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "පවතින අවස්ථාවක දී, 49 වන වගන්තියේ (2) වන, (3) වන, (4) වන, (5) වන හෝ (6) වන උපවගන්තිවල";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

46 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 32 වැනි පිටුවේ 16 වැනි පේළියේ සිට 20 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "වොරන්ට් පතක් නිකුත් කිරීම
>
> 46. 45 වන වගන්තිය යටතේ බලය පැවරීම පිළිබඳ බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු වොරන්ට් පතක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොමිෂන් සභාවේ යම් නිලධරයන් වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.";;

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

47 වැනි වගන්තිය සභා සම්මත විය.

48 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 35 වැනි පිටුවේ 27 වැනි පේළිය සහ 28 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"අත්අඩංගුවට ගනු ලැබූ තැනැත්තාව නොපමාව අධිකරණ බලය සහිත";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

49 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 36 වැනි පිටුවේ 26 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, කොමිෂන් සභාව විසින් මේ ඡේදයේ සඳහන් විධිවිධාන යටතේ යම් තැනැත්තකු පරීක්ෂා කිරීම දෘශ්‍ය ලෙස වාර්තා කරනු ලැබිය හැකිය;";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 38 වැනි පිටුවේ 10 වැනි පේළියේ සිට 12 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"පනතේ විධිවිධාන යටතේ යම් විමර්ශනයක් පැවැත්වීමේ කාර්ය සඳහා හෝ මේ පනතේ සඳහන් යම් ආශ්‍රිත වරදක් සම්බන්ධයෙන් එම නිලධරයාගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් තොරතුරක් හෝ ලේඛනයක් හෝ එහි යම් සහතික පිටපතක් හෝ සටහනක් සපයන"; සහ

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 40 වැනි පිටුවේ 12 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"කොමසාරිස්වරයකු; හෝ

(xxi) මේ පනත යටතේ යම් උපලේඛනගත ආයතනයක ප්‍රධානියා;";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

50 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 43 වැනි පිටුවේ 15 වැනි පේළියේ සිට 17 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"විශේෂඥයකු හෝ රජයේ වෛද්‍ය වෘත්තිකයකු විසින් පවත්වනු ලබන
පරීක්ෂණයකට භාජනය වනු ලැබීම සඳහා එම";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

51 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 46 වැනි පිටුවේ 11 වැනි පේළියේ සිට 14 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(8) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ රුධිර සාම්පලයක්, ඇඟිලිවල අත්ලේ හෝ පත්ලේ සලකුණක් හෝ ශරීරයේ වෙනත් යම් කොටසක සලකුණක් හෝ (4) වන උපවගන්තිය යටතේ රහස්‍ය නොවන සාම්පලයක් ලබා ගැනීම සඳහා කැමැත්ත ලබා නොදෙන්නේ නම්, කොමිෂන් සභාව විසින් එසේ ඒවා ඔහුගෙන් ලබා ගැනීම සඳහා නියෝගයක් ලබා ගැනීම පිණිස; සහ

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 47 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 4 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" (13) පෞද්ගලිකත්වය සහ රහස්‍ය නොවන සාම්පල භාවිතය පිළිබඳ සීමාවන්, ව්‍යවහාරික විශ්ලේෂණ ප්‍රතිඵල සහ සාම්පල සහ වාර්තා බැහැර කිරීම පිළිබඳව වන සීමා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව විමසා නියෝග සාදනු ලැබිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු නීතිඥ වන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 47 වැනි පිටුවේ 3 වැනි පේළිය සහ 4 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" 'කිරීම පිළිබඳව වන රහස්‍යභාවය සහ සීමා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය යුතුය.' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

52 වැනි වගන්තිය සභා සම්මත විය.

53 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 49 වැනි පිටුවේ 24 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" පවතින දින හතක කාලසීමාව තුළ දී, එම තහනම් නියෝගය";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 49 වැනි පිටුවේ 27 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" මුල් දින හතක කාලසීමාව දීර්ඝ කිරීමක් ඉල්ලා සිටිනු ලැබිය"; සහ

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 52 වැනි පිටුවේ 9 වැනි පේළිය සහ 10 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" මිලියන එකක් නොඉක්මවන දඩ මුදලකින් දඬුවම්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

54 වැනි වගන්තිය සභා සම්මත විය.

55 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 54 වැනි පිටුවේ 17 වැනි පේළිය සහ 18 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ඉ) රහසිගත ශ්‍රව්‍ය පටිගත කිරීමේ උපාංග භාවිතය;

හෝ

(ඊ) පාලනයට නතු බාරදීම්:

එසේ වුව ද, කොමිෂන් සභාව විසින් මේ වගන්තිය යටතේ විමර්ශන ක්‍රමවේද භාවිතා කරනු ලැබීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටීන් රීති මඟින් දක්වනු ලැබිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

56 වැනි වගන්තියේ සිට 61 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

62 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 60 වැනි පිටුවේ 19 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"මූලාශ්‍රය හෙළිදරව් කිරීමට";

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

63 වැනි සහ 64 වැනි වගන්ති සභා සම්මත විය.

65 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 64 වැනි පිටුවේ 21 වැනි පේළියේ සිට 32 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''අධ්‍යක්ෂ ජනරාල්වරයාට නියෝග කළ යුතු ය.''; සහ

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 65 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 5 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 66 වැනි පිටුවේ 28 වැනි පේළිය සහ 29 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''කොමිෂන් සභාවේ අවසරය ලැබූ කොමිෂන් සභාවේ නිලධරයකු, කොමිෂන් සභාවේ ඉල්ලීම මත නීතිපතිවරයා හෝ ඒ'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

66 වැනි වගන්තිය සභා සම්මත විය.

67 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 68 වැනි පිටුවේ 9 වැනි පේළිය ඉවත්කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 69 වැනි පිටුවේ 10 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''අලුත් අධිචෝදනාවක් ගොනු කළ යුතු අතර ඒ කොන්දේසි'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 67 වැනි පිටුවේ 28 වැනි පේළියේ සිට 30 වැනි පේළිය දක්වා වන පේළි ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 68 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 28 වැනි පේළිය දක්වා වන පේළි ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 69 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 12 වැනි පේළිය දක්වා වන පේළි ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

68 වැනි වගන්තිය සභා සම්මත විය.

69 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 70 වැනි පිටුවේ 28 වැනි පේළියේ සිට 32 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

70 වැනි වගන්තිය සභා සම්මත විය.

71 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 72 වැනි පිටුවේ 10 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''අත්හිටුවීමට සහ කල් තැබීමට මේ වගන්තියේ (8) වන උපවගන්තිය යටතේ ගිවිසුමකට එළඹිය හැකිය;

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 73 වැනි පිටුවේ 5 වැනි පේළියේ සිට 7 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 73 වැනි පිටුවේ 28 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''කළ යුතු ය.''; සහ

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 74 වැනි පිටුවේ 5 වැනි පේළියේ සිට 11 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(8) මේ වගන්තියේ සඳහන් කරනු ලබන තැනැත්තා සංස්ථාගත කළ පුද්ගල මණ්ඩලයක් වන අවස්ථාවක දී, මේ වගන්තිය යටතේ වන ගිවිසුමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ එම සංස්ථාගත කළ පුද්ගල මණ්ඩලය සමඟ එළඹිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 72 වැනි පිටුවේ 21 වැනි පේළියේ සිට 30 වැනි පේළිය දක්වා වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" '(3) මේ පනත යටතේ වරදක් සිදු කර ඇතැයි කියනු ලබන යම් තැනැත්තකුට එරෙහිව අපරාධ නඩු කටයුත්තක් කල් තැබීමට හෝ අත්හිටුවීමට (1) වන උපවගන්තියේ නියමයන් ප්‍රකාර කොමිෂන් සභාව එකඟ වන අවස්ථාවකදී, ඒ තැනැත්තාට එරෙහිව අපරාධ නඩු කටයුත්තක් අත්හිටුවීමට සහ කල්තැබීම සඳහා සලකා බැලීමක් ලෙස ඒ තැනැත්තා වෙත නියම කරන කාලයක් තුළ සම්පූර්ණ කළ යුතු (අ) සහ (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ) හි එකක් හෝ ඊට වැඩි ගණනක් පැනවීම සඳහා මහාධිකරණයේ අවසරය ලබා ගැනීමට කොමිෂන් සභාව විසින් මහාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය.' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 73 වැනි පිටුවේ 7 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" 'දැරීමෙන් වැළකීමට' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 73 වැනි පිටුවේ 8 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" '(ඉ) විමර්ශන පැවැත්වීමේ කාර්යය සහ එයට ආනුෂංගික කරුණු සඳහා පමණක් වරදට අදාළ මුළු මුදල වන්දි ලෙස රජයට ගෙවීමට සහ' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 73 වැනි පිටුවේ 10 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

" '(ඊ) අධිකරණය විසින් තීරණය කරනු ලබන මුදලක් වන්දි වශයෙන් අපරාධයේ වින්දිතයන් වෙත ගෙවීමට.' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

72 වැනි වගන්තිය සභා සම්මත විය.

73 වැනි වගන්තිය

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 75 වැනි පිටුවේ 26 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" 'මිලියනයක් නො ඉක්මවූ දඩයකට හෝ මාස තිහක් නොඉක්මවන කාලයක්' "

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්:

'' දඩය රුපියල් පනස් දහස වෙනුවට රුපියල් ලක්ෂයක් විය යුතුය.''

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

74 වැනි වගන්තියේ සිට 79 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

80 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 83 වැනි පිටුවේ 21 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

'' (ක) ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ රාජ්‍ය බැංකුවල මාණ්ඩලික නිලධරයන්;'' සහ

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 85 වැනි පිටුවේ 20 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(ඈ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 25 දරන ක්‍රීඩා පනත ප්‍රකාරව පිහිටුවනු ලැබූ ජාතික ක්‍රීඩා සංගම්වල ධුර දරන නිලධරයන්; සහ

(ඉ) යම් නිලධරයන් ඔවුන්ට අදාළ යම් නිලයන්වල කටයුතු''; සහ

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 85 වැනි පිටුවේ 23 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''ඇති ඉඩකඩ සැලකිල්ලට ගනිමින් අධිඅවදානම් කාණ්ඩ ලෙස නියෝග මඟින් නියම'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 83 වැනි පිටුවේ 21 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

'' 'ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ රජයේ බැංකුවල මාණ්ඩලික නිලධරයන්;' ''

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 85 වැනි පිටුවේ 25 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

'' '(ඉ) ඒකාබද්ධ අරමුදලින් වෙන්කළ මුදලකින් යම් ආකාරයේ පාරිශ්‍රමිකයක් ලබාගන්නා ඕනෑම අයෙකු.' ''

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

81 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 86 වැනි පිටුවේ 1 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''81. මේ කොටස අදාළ වන සෑම තැනැත්තකුම (මෙහි මින්''; සහ

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 86 වැනි පිටුවේ 18 වැනි පේළියේ සිට 22 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 86 වැනි පිටුවේ 18 වැනි පේළියේ සිට 22 වැනි පේළිය දක්වා වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''(2) මේ වගන්තියේ කාර්යය සඳහා, ''වත්කම් සහ බැරකම්'' යන්නෙන්, සමස්තයක් ලෙස හෝ කොටසක් ලෙස ප්‍රකාශක සතුව ශ්‍රී ලංකාව තුළ හා ඉන් පිටත පවත්නා බැරකම් හෝ බැංකු තැන්පතුවක් ලෙස හෝ යම් ආකාරයකින් ප්‍රකාශක විසින් රඳවා තිබෙන චංචල හෝ නිශ්චල දේපළ හෝ ප්‍රකාශක වෙත ප්‍රයෝජනවත් ප්‍රතිලාභ සැලසෙන්නා වූ යම් දේපළක් හා ප්‍රකාශය අදාළ වන කාලසීමාව තුළ ප්‍රකාශක විසින් හෝ ඔහුගේ කලත්‍රයා හෝ දරුවෙකුගේ නමට අත්පත් කරගෙන ඇති යම් දේපළක්, ආයතනික කොටස් හිමිකම්, ප්‍රත්‍යාදේශ්‍ය නොවන ටෝකන, ක්‍රිප්ටොකරන්සි සියලු ගුප්තකේතන හා ඩිජිටල් වත්කම්, සමාගම්වල අධ්‍යක්ෂ ධුර, ප්‍රතිලාභදායක සමාගම් හිමිකාරිත්වයන්, මූල්‍ය බැඳීම්, සමගාමී කටයුතු, අභිලාෂයන් අතර පිළිගැටුම්, සංවිධානවල හා ඒවාහි පාලන ආයතනයන්හි සාමාජිකත්වයන් අදහස් වේ.''

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

82 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 87 වැනි පිටුවේ 28 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''තැනැත්තකු බවට ඔහු පත්වන දින සිට ඔහු''; සහ

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 87 වැනි පිටුවේ 31 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" 'එසේ වුව ද, 80 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ප)";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 87 වැනි පිටුවේ 31 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

'එසේ වුවද, 80 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ)' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

83 වැනි වගන්තිය සභා සම්මත විය.

84 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 90 වැනි පිටුවේ 22 වැනි පේළියේ සිට 24 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(3) (2) වන උපවගන්තිය යටතේ සිදු කරනු ලබන සත්‍යායනයක් මගින් යම් අයථා පොහොසත්වීමක් සොයා ගැනීම 42 වන වගන්තිය යටතේ වන විමර්ශනයට මඟ සලස්වනු ඇත.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

85 වැනි වගන්තියේ සිට 87 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

88 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 92 වැනි පිටුවේ 2 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ඉදිරිපත් කළ දින සිට මාසයක් ඇතුළත ස්වයංක්‍රීයව ම නිකුත්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 92 වැනි පිටුවේ 10 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"සඳහා උපන් දිනය, ජාතික හැඳුනුම්පත් අංකය, විදේශ"; සහ

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 92 වැනි පිටුවේ 13 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ඇ) බැංකු ගිණුම් අංක; හෝ

(ඉ) වෙනත් යම් තැන්පතු විස්තර,";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 92 වැනි පිටුවේ 1 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" 'කළ පිටපතක් කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියට පිවිස, පූර්වයෙන් ලියාපදිංචි වූ විද්‍යුත් තැපැල් ගිණුමක් මගින් එය' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

89 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 92 වැනි පිටුවේ 21 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"89. 80 වන වගන්තියේ (ප) ඡේදයේ සඳහන් කරන ලද";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

90 වැනි වගන්තිය

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: ඉංග්‍රීසි භාෂා පිටපතෙහි 84 වැනි පිටුවේ 30 වැනි පේළියේ සිට 33 වැනි පේළිය දක්වා වූ පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

" '(4) Where any person fails to submit his declaration of assets and liabilities along with his application form for nomination for an election, such application form for nomination shall be deemed to be invalid.' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

91 වැනි වගන්තිය සභා සම්මත විය.

92 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 97 වැනි පිටුවේ 3 වැනි පේළියේ සිට 5 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "හෝ පිටත, සෘජුව හෝ අර්ථදායක ලෙස හිමි නියෝග මඟින් එහි විස්තර නියම කරනු ලැබිය යුතු, වත්කම්, බැරකම්, ආදායම්, වියදම් සහ පොලී මුදල් අදහස් වේ.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

93 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 97 වැනි පිටුවේ 11 වැනි පේළියේ සිට 13 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "නිලධරයකුට, විනිශ්චය සභාවක හෝ ආයතනයක සාමාජිකයකුට හෝ අර්ධ-අධිකරණ බලය ක්‍රියාත්මක කරන තැනැත්තකුට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට, පළාත් සභා මන්ත්‍රීවරයකුට හෝ පළාත් පාලන ආයතනයක සභිකයකුට එකී විනිසුරුවරයා, නිලධරයා, තැනැත්තා හෝ මන්ත්‍රීවරයා විසින් තම අධිකණමය තත්ත්වයෙන්, මන්ත්‍රීවරයකුගේ හෝ සභිකයකුගේ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 97 වැනි පිටුවේ 19 වැනි පේළිය සහ 20 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "අධිකරණ නිලධරයකුව සිටිමින් හෝ විනිශ්චය සභාවක හෝ ආයතනයක සාමාජිකයකුව සිටිමින් හෝ අර්ධ-අධිකරණ බලය ක්‍රියාත්මක කරන තැනැත්තකුව සිටිමින් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභාවක මන්ත්‍රීවරයකුව හෝ පළාත් පාලන ආයතනයක සභිකයකුව සිටිමින් එකී අධිකරණමය තත්ත්වයෙන් හෝ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 97 වැනි පිටුවේ 29 වැනි පේළිය සහ 30 වැනි පේළිය ඉවත්කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 98 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 6 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) සහ පැති සටහන ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ, මහාධිකරණයේ විනිසුරුවන්, අධිකරණ නිලධරයන්, විනිශ්චය සභාවක හෝ ආයතනයක සාමාජිකයන් සහ අර්ධ අධිකරණ බලය ක්‍රියාත්මක කරන තැනැත්තන් සහ පාර්ලිමේන්තු සහ පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සහ පළාත් පාලන ආයතන සභිකයන්ගේ අල්ලස්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

94 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 98 වැනි පිටුවේ 13 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"හෝ පිළිගන්නා යම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු මේ පනත යටතේ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

95 සිට 98 දක්වා වගන්ති දක්වා සභා සම්මත විය.

99 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 101 වැනි පිටුවේ 15 වැනි පේළියේ සිට 18 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"එසේ වුව ද, (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

100 වැනි වගන්තිය සභා සම්මත විය.

101 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 103 වැනි පිටුවේ 15 වැනි පේළියේ සිට 20 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

102 සිට 107 දක්වා වගන්ති සභා සම්මත විය.

108 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 111 වැනි පිටුවේ 23 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"(4) මේ වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, 2019 අංක 24 දරන ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ පනතේ II වන කොටසේ 1වන පරිච්ඡේදයේ වැරදි සඳහා පිළිවෙලින් එම වගන්තිවල ඒ සඳහා ලබා දී ඇති අර්ථයන් ම තිබිය යුතු අතර ඒ සඳහා එම වගන්තිවල නිශ්චිතව දක්වා ඇති දණ්ඩනම තිබිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

109 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 111 වැනි පිටුවේ 24 වැනි පේළිය සහ 25 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"මේ පනත යටතේ වන වරදක් මඟින් ධනය රැස්කිරීම

109. (1) යම් තැනැත්තකු යම් දේපළක් අත්කරගෙන තිබෙන අවස්ථාවක දී හෝ අත්කරගෙන තිබූ අවස්ථාවක දී, එකී දේපළ-";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 112 වැනි පිටුවේ 13 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"බවට හෝ වූ බවට හෝ ඒ තැනැත්තා විසින් මේ පනත යටතේ යම් වරදක්"; සහ

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 112 වැනි පිටුවේ 16 වැනි පේළිය සහ 17 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(2) (1) වන උපවගන්තියේ "ආදායම" යන්නට, මේ පනත යටතේ වන වරදක් මඟින් උපයා ගත් ආදායමක් ඇතුළත් නොවන අතර, "ලැබීම්" යන්නට, මේ පනත යටතේ වන වරදක් මඟින් උපයා";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 115 වැනි පිටුවේ 4 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"(10) ඒ දේපළ මේ පනත යටතේ වන වරදක් මඟින් උපයාගත් දෙයක ප්‍රතිඵලයක් බව දැන දැනම මේ පනත යටතේ සිදු කරන ලද වරදක් මඟින් උපයාගත් දේ හෝ ඉන් යම් කොටසක් සඟවා තබාගන්නා හෝ තබාගෙන සිටින යම් තැනැත්තකු වසර හතකට නොවැඩි කාලසීමාවක් සඳහා බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම හෝ යටත් වන වරදක් සිදු කරනු ලබන්නේ ය:

එසේ වුව ද, ඔහු විසින් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් අතරමැදියන් මාර්ගයෙන් හෝ ඔහුගේ ප්‍රතිලාභය පිණිස හෝ වෙනත් තැනැත්තකුගේ හෝ අස්ථිත්වයක ප්‍රතිලාභය පිණිස එකී උපයාගත් දේ සඟවා තැබීම හෝ තබාගෙන සිටීම සිදු කළ ද නොකළ ද යම් තැනැත්තකු උපයාගත් දේ හෝ එයින් යම් කොටසක් සඟවා තබාගනු හෝ තබාගෙන සිටිනු ලබන්නේ ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

110 වැනි වගන්තිය

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 115 වැනි පිටුවේ 9 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" 'හෝ වැළකී සිටින හෝ වාසියක් දීමට, සැපයීමට හෝ වැළකී' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 115 වැනි පිටුවේ 11 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" 'තැනැත්තකු වාසියක් පිරිනමනු ලබයි.' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 115 වැනි පිටුවේ 15 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" 'සඳහා කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් යම් වාසියක් ඉල්ලා,' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 115 වැනි පිටුවේ 17 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" 'ඇත්නම් එකී යම් තැනැත්තා වාසියක් ඉල්ලා සිටිනු ලබයි.' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 115 වැනි පිටුවේ 21 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" 'කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් යම් වාසියක් ගන්නේ නම්, භාර' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු නීතිඥ වන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 115 වැනි පිටුවේ 23 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" 'හෝ ලබා ගැනීමට එකඟ වන්නේ නම්, එකී තැනැත්තා වාසියක්' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු නීතිඥ වන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 115 වැනි පිටුවේ 25 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" 'මේ පනත යටතේ වරදක් වන වාසියක් පිරිනැමීම, ඉල්ලා' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

111 වැනි වගන්තිය සභා සම්මත විය.

112 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 117 වැනි පිටුවේ 5 වැනි පේළිය සහ 6 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"කරන ලද වරදකට අමතරව, ඒ පනත යටතේ වන වරදක් සඳහා ද චෝදනා ගොනු කරනු ලැබිය හැකිය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 117 වැනි පිටුවේ 8 වැනි පේළිය සහ 9 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම පනත යටතේ එකී වරද සම්බන්ධයෙන් වන පරීක්ෂණ, විමර්ශනය සහ නඩු කටයුතු සඳහා අදාළ කර ගත යුතු අතර, සහකාර"; සහ

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 117 වැනි පිටුවේ 12 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"කොමිෂන් සභාව මඟින් නම් කරන ලද යම් නිලධරයකුට කරන";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

113 වැනි වගන්තිය සභා සම්මත විය.

114 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 121 වැනි පිටුවේ 19 වැනි පේළිය සහ 20 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ii) ඒ තැනැත්තා එසේ වරදකරු කරනු ලැබූ දිනයේ සිට හෝ තීරණයේ දින සිට";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 122 වැනි පිටුවේ 14 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

" '(8) මේ පනතේ වෙන යම් විධිවිධානයක පැටහැනිව කවරක් සඳහන් වුවද, මේ පනතේ 111 වගන්තිය යටතේ යම් වරදක් සම්බන්ධයෙන් අධිකරණය විසින් රජයේ නිලධරයෙකු වැරදිකරු බවට ප්‍රකාශයට පත් කරන විටදී, එම රජයේ නිලධරයා වෙත ලබාදී ඇති යම් ප්‍රදානයක්, පත්වීමක් හෝ වෙනයම් ප්‍රතිලාභයක් නීති විරෝධී සහ ශූන්‍ය හා බලරහිත බවට අධිකරණය විසින් නියෝග කළ හැක.

(9) 111 වගන්තිය යටතේ යම් වරදක් සම්බන්ධයෙන් රජයේ නිලධරයෙකු වැරදිකරු බවට පත් වුවහොත්, අධිකරණය විසින් එම නිලධරයා හට රජයට සිදුවූ අලාභය ගෙවන ලෙස නියෝග කළ හැක.

(10) රජයේ පාසලකට දරුවෙකු ඇතුළත් කිරීම උදෙසා,

(අ) පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් රජයේ නිලධරයෙකු වෙත යම් තුටු පඩුරක් පිරිනමන;හෝ

(ආ) රජයේ නිලධරයෙකු වශයෙන් කටයුතු කරමින්, පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් යම් තුටු පඩුරක් ඉල්ලා සිටින හෝ පිළිගනු ලබන ඕනෑම පුද්ගලයෙකු මෙම පනත යටතේ අල්ලස් වරදක් සිදුකරන අතර මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ වරදකරු කරනු ලැබීමෙන් අනතුරුව රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට සහ වසර හතක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතුය.' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

115 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 123 වැනි පිටුවේ 8 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ සිදු";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

116 වැනි වගන්තිය

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 125 වැනි පිටුවේ 5 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> '' 'අදාළ වරද සම්බන්ධයෙන් නිශ්චිතව දක්වා ඇති දඩයකට හෝ බන්ධනාගාරගත කිරීමකට යටත්' ''

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

''වගන්තිය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

117 සහ 118 වැනි වගන්ති සභා සම්මත විය.

119 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 129 වැනි පිටුවේ 8 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''නොඉක්මවන දඩයකට හෝ වසර තුනක් නොඉක්මවන කාලයක්'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 129 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 14 වැනි පේළිය දක්වා වූ පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> '' 'එකී චෝදනාව අසත්‍ය බව දැන දැනම 43 වන වගන්තිය යටතේ ඔහු විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන යම් තොරතුරකදී හෝ පැමිණිල්ලකදී යම් අසත්‍ය චෝදනාවක් කරන සෑම තැනැත්තකුම මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ වසර දෙකක් නොඉක්මන කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු අතර, ඊට අමතරව, එම චෝදනාව සිදු කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, එම තැනැත්තාට අධිකරණය විසින් සුදුසු යැයි සලකනු ලැබිය හැකි යම් මුදලක් වන්දියක් ලෙස ගෙවීමට ද යටත් විය යුතුය.' ''

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

120 වැනි වගන්තිය

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 129 වැනි පිටුවේ 18 වැනි පේළියේ සිට 20 වැනි පේළිය දක්වා වූ පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" 'කරනු ලබන අතර, මහාධිකරණයක් ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට හෝ වසර පහක් නොඉක්මවන' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

121 සිට 124 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

125 වැනි වගන්තිය

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 132 වැනි පිටුවේ 9 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" 'පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට යටත්' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්:

" දඩය රුපියල් පනස් දහස වෙනුවට රුපියල් ලක්ෂයක් විය යුතුය."

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

126 වැනි වගන්තිය සභා සම්මත විය.

127 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 135 වැනි පිටුවේ 27 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"වෙනත් යම් තැනැත්තකුට හෙළිදරව් කරන; හෝ

(ග) මේ පනත යටතේ වන වරදක ප්‍රතිඵලයක් ලෙස ලැබුණු මුදල් හෝ ඉන් කොටසක්, එකී මුදල් හෝ ඉන් කොටස සැඟවීම හෝ තබා ගැනීම කෙලින්ම හෝ අන්‍යාකාරයකින් අතරමැදියන් මාර්ගයෙන් හෝ තමාගේ ම ප්‍රතිලාභය සඳහා හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අස්ථිත්වයක ප්‍රතිලාභය සඳහා හෝ සැඟවීම හෝ තබා ගැනීම කරනු ලැබුව ද, නොලැබුව ද, එවැනි මුදල් හෝ ඉන් කොටසක් සඟවනු ලබන හෝ තබා ගනු ලබන,";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

128 වැනි වගන්තිය සභා සම්මත විය.

129 වැනි වගන්තිය

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 137 වැනි පිටුවේ 11 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" 'නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියනයක්' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්:

" දඩය රුපියල් පනස් දහස වෙනුවට රුපියල් ලක්ෂයක් විය යුතුය."

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

130 සිට 135 වැනි වගන්ති දක්වා සභා සම්මත විය.

136 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 139 වැනි පිටුවේ 20 වැනි පේළියේ සිට 26 වැනි පේළිය දක්වා වූ (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(3) මේ පනත ප්‍රකාර වරදක් සංස්ථාපනය වන යම් ක්‍රියාවක් සමඟ එක්ව එකම ක්‍රියාකලාපයක දී කරනු ලැබූ මේ පනතේ අ උපලේඛනයේ සහ ආ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වරදවල් සඳහා පිළිවෙළින් ඒ පනත්වල ඒ සඳහා එම පනත්වල නිශ්චිතව දක්වා ඇති දණ්ඩන ම තිබිය යුතු ය:

එසේ වුව ද, එම පිළිවෙළින් වූ පනත්වල නිශ්චිතව දක්වා ඇති යම් වරදක් සඳහා වූ දණ්ඩනය රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩ මුදලක් හෝ අවුරුදු හතක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයක් හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙක ම වන දණ්ඩනවලට වඩා අඩු වන අවස්ථාවක දී එම වරදවල් සඳහා රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩ මුදලක් හෝ අවුරුදු හතක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයක් හෝ එම දඩ මුදල සහ බන්ධනාගාරගත කිරීම යන දෙක ම හෝ අදාළ විය යුතු ය.";

(4) (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රයේ කුමක් සඳහන් වුව ද, මේ පනතේ කාර්ය සඳහා "දේපළ" යන්නෙන් ද්‍රව්‍යමය හෝ ද්‍රව්‍යමය නොවන, චංචල හෝ නිශ්චල, ස්පර්ශ කළ හැකි හෝ ස්පර්ශ කළ නොහැකි සහ එකී වත්කම්වල හිමිකම හෝ බැඳියාවට සාක්ෂි වන නෛතික ලේඛන හෝ සාධන පත්‍ර ඇතුළත් වන ඕනෑම ආකාරයක "වත්කම්" අදහස් වේ.

(5) මේ පනත සඳහා 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන අදාළ වේ.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

137 සිට 140 වැනි වගන්ති දක්වා සභා සම්මත විය.

141 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 140 වැනි පිටුවේ 23 වැනි පේළිය සහ 24 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"විශේෂ අවස්ථානුගත කාරණා හේතුවෙන් එසේ කිරීම වළක්වන්නේ නම් මිස, රාජ්‍යය සම්බන්ධයෙන් ඇති වැදගත්කම සහ බලපෑම සැලකිල්ලට ගනිමින්, ජාතික ආර්ථිකයේ යහපත පිණිස, පාලනයේ සුපිළිපන්නභාවය, විවෘතභාවය සහ වගවීම අභිවර්ධනය කිරීම සඳහා සහ පෞද්ගලික අංශයේ කටයුතුවල සුපිළින්නභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා මේ පනත යටතේ වන වැරදි සම්බන්ධයෙන්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

142 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 141 වැනි පිටුවේ 4 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ඒවායේ කොටසක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 106 වන ව්‍යවස්ථාවට යටත්ව යම් අධිකරණයක දී රහසේ පැවැත්විය හැකි ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

143 සිට 148 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

149 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 144 වැනි පිටුවේ 20 වැනි පේළියේ සිට 33 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ඇප

149. (1) මේ පනත යටතේ වන සියලු වැරදි සංඥේය සහ ඇප දිය නොහැකි වැරදි වන අතර මේ පනත යටතේ වරදක් සිදු කිරීම සම්බන්ධව සැලකිල්ලට භාජනය වන බවට හෝ වරදක් සිදු කොට ඇති බවට සැක කරනු ලබන හෝ චෝදනා කරනු ලැබ සිටින යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පෙනී සිටින, ඉදිරියට ගෙන එනු ලබන, ඉදිරිපත් කරන හෝ භාර වන අවස්ථාවේ දී, මහෙස්ත්‍රාත්වරයා විසින් 1997 අංක 30 දරන ඇප පනතේ විධිවිධාන ප්‍රකාරව ඇප ලබා දෙනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ පනත යටතේ වන වරදක් සංයුක්ත වන තුටු පඩුරක් ඉල්ලා ඇති, පිළිගෙන ඇති හෝ පිරිනමා ඇති බවට අනාවරණය වන යම් තැනැත්තකු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම අනාවරණය කිරීම ස්ථිර කරනු ලබන සහතිකයක් සමඟ

මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියට ගෙන එනු ලබන, ඉදිරිපත් කරන හෝ භාර වන අවස්ථාවක මහෙස්ත්‍රාත්වරයා විසින් විනිශ්චය අවසන් වනතුරු රිමාන්ඩ් භාරයේ තබනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මහෙස්ත්‍රාත්වරයා විසින්, විශේෂ අවස්ථානුගත කාරණාවල දී සහ හේතු වාර්තා කර විනිශ්චය අවසන් වීමට පෙරාතුව ඕනෑම වේලාවක දී එකී තැනැත්තා ඇප මත නිදහස් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එකී උපවගන්තිය යටතේ වුව ද, එකී උපවගන්තිය යටතේ වන යම් නඩු කටයුත්තක දී, අත්අඩංගුවේ සිටින තැනැත්තාට විරුද්ධව නඩු පැවරීමට කොමිෂන් සභාව අපේක්ෂා නොකරන බව කොමිෂන් සභාව විසින් මහෙස්ත්‍රාත්වරයා වෙත දන්වනු ලැබූ අවස්ථාවක, එකී තැනැත්තා වහාම නිදහස් කරනු ලැබිය යුතු ය; සහ

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 145 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 3 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

150 සිට 155 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

156 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 150 වැනි පිටුවේ 6 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව විමසා නියෝග සාදනු ලැබිය හැකි ය.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

157 සහ 158 වැනි වගන්ති සභා සම්මත විය.

159 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 151 වැනි පිටුවේ 15 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''වාර්තා පෞද්ගලිකත්වයට සහ පුද්ගලික තොරතුරුවලට නිසි සැලකිල්ලක් දක්වා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හරහා ජනතාවට'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

160 සහ 161 වැනි වගන්ති සභා සම්මත විය.

162 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 152 වැනි පිටුවේ 10 වැනි පේළියේ සිට 14 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''(ආ) මේ පනතේ ආණ්ඩුව සඳහා යෙදී ඇති සෑම සඳහනක්ම, අධිකරණයට බාධාවක් ඇති නොකරන ආකාරයෙන් තේරුම් ගනු ලැබිය යුතු අතර එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ ව්‍යවස්ථාවට යටත් විය යුතු ය.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 152 වැනි පිටුවේ 22 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

> '' ''ආශ්‍රිත වැරදි'' යන්නෙන්, මේ පනතේ නිශ්චිතව දක්වා ඇති වෙනත් වැරදි හැර මේ පනතේ 41 වන වගන්තියේ සඳහන් කර ඇති වැරදි අදහස් වේ;'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 155 වැනි පිටුවේ 26 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

> ''දේශීය හෝ විදේශීය විශේෂඥයකු යන්නට, (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥා පනතේ 45 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් විශේෂඥයකු ඇතුළත් වේ;'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 157 වැනි පිටුවේ 5 වැනි පේළිය සහ 6 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''තැනැත්තා'' යන්නට, ස්වභාවික හා නෛතික තැනැත්තන් යන දෙවර්ගය ම ඇතුළත් වේ.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 157 වැනි පිටුවේ 20 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''දෙපාර්තමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන හෝ රාජ්‍ය සංස්ථා''; සහ

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 158 වැනි පිටුවේ 9 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"රජයේ සේවකයා" යන්නට, ජනාධිපතිවරයා, අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලයේ"; සහ

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 160 වැනි පිටුවේ 12 වැනි පේළියේ සිට 15 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ආ) ලිංගික සංසර්ගය ලෙසට සැලකිය නොහැකි එහෙත් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය හෝ වෙනත් යම් මාධ්‍යයක් භාවිත කිරීම ඔස්සේ ශරීරයේ රහස් කොටසක් නිරාවරණය කිරීම හෝ යම් ක්‍රියාවක් සිදු කිරීම ඇතුළත්ව ලිංගික ආකාරයෙන් කායික, වාචික හෝ වාචික නොවන හැසිරීමකට ගණන් ගැනෙන හෝ එවැන්නක් සංස්ථාපනය විය හැකි, යම් ක්‍රියාවක්,";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 154 වැනි පිටුවේ 18 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" 'ලිංගික අල්ලසක්' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 160 වැනි පිටුවේ 10 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" ' "ලිංගික අල්ලස" යන්නෙන්,' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු උදයන කිරිඳිගොඩ මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 154 වැනි පිටුවේ 10 වැනි පේළියේ "තුටුපඬුරු" යන්නට ඉක්බිතිව පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

" 'ඕනෑම ආකාරයක විද්‍යුත් මුදල් ඒකකයක්' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු උදයන කිරිඳිගොඩ මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 154 වැනි පිටුවේ 12 වැනි පේළියේ "චංචල හෝ" යන්නට ඉක්බිතිව පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

'ස්පර්ශ කළ නොහැකි හා අතථ්‍ය,' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු උදයන කිරිඳිගොඩ මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 154 වැනි පිටුවේ 13 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

'මේ ඡේදයේ කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ වලංගු මුදල් ලෙස යම් මුදල් පිළිගෙන ඇත්තේ ද නොමැත්තේ ද යන්න නොසලකා වලංගු මුදල් ලෙස පිළිගෙන ඇති ඩිජිටල් හෝ පරිගණක ආකෘතියකින් මුදල් ඇතුළත් වේ.' "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

163 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 164 වැනි පිටුවේ 17 වැනි පේළියේ සිට 25 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී අවසන් නොවී පවතින සියලු නඩු, නඩු පැවරීම් සහ වෙනත් නීති කෘත්‍ය සහ ආරම්භ කරන ලද පරීක්ෂණ හෝ විමර්ශන මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් හෝ ඊට එරෙහිව පවරනු ලැබූ නඩු, නඩු පැවරීම් සහ වෙත් නීති කෘත්‍ය ලෙස සහ ආරම්භ කරන ලද පරීක්ෂණ හෝ විමර්ශන ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ පවරනු ලැබ අඛණ්ඩව විනිශ්චයට ගනු ලැබූ නඩු, නඩු පැවරීම් සහ වෙනත් නීති කෘත්‍ය වූවාක් සේ නියමිත දිනට පසු අඛණ්ඩව විනිශ්චය ගනු ලැබිය යුතු අතර ආරම්භ කරන ලද පරීක්ෂණ හෝ විමර්ශන අඛණ්ඩව පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 165 වැනි පිටුවේ 16 වැනි පේළියේ සිට 25 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "(ඌ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරන්නා වූ 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ පිහිටුවනු ලැබූ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සියලු නිලධරයන් සහ සේවකයන්, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ ඔවුන්ට හිමිව තිබූ රැකියා නියම සහ කොන්දේසිවලට වඩා අවාසිදායක නොවන නියම යටතේ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලාත්මක වන පරිදි කොමිෂන් සභාවේ නිලධරයන් සහ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඔවුන් විසින් කොමිෂන් සභාව පිහිටුවා මාස තුනක් ඇතුළත කොමිෂන් සභාවේ සේවයට එක් වීම තීරණය කරන්නේ ද යන්න කොමිෂන් සභාවට දන්වනු ලැබිය යුතු ය:
>
> එසේ වුව ද,
>
> (i) කොමිෂන් සභාවට එක්වීමට තීරණය කරන සෑම නිලධාරියෙකු ම සහ සේවකයකු ම විශ්‍රාම වැටුප් සහ වෙනත් විශ්‍රාම ප්‍රතිලාභ ගණනය කිරීමේ කාර්ය සඳහා පමණක් 1994 අංක 19 දරන පනත යටතේ පිහිටුවන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ රජයේ නිලධරයකු ලෙස එම කොමිෂන් සභාව විසින් ඔහු සේවයට බඳවා ගනු ලැබූ දින සිට මේ පනත යටතේ පිහිටු වනු ලබන කොමිෂන් සභාවේ ඔහුගේ සේවා කාලය අවසන් වනු ලබන තෙක් ධුරයේ අඛණ්ඩව කටයුතු කරනු ලබන බවට සලකනු ලැබිය

යුතු අතර ඔහුගේ කොමිෂන් සභාවේ සේවා කාලය රජයේ නිලධරයකු ලෙස ඔහුගේ පෙර සේවා කාලයට එකතු කරනු ලැබූ විට වසර විස්සක් හෝ ඊට වැඩි වේ නම්, කොමිෂන් සභාවේ සේවා කාලය අවසානයේදී විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය ඇතුළුව වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ එම නිලධරයන්ට සහ සේවකයන්ට අදාළ විය හැකි විශ්‍රාම වැටුප් සහ විශ්‍රාම ප්‍රතිලාභ ප්‍රදානය කිරීමට සුදුසුකම් ලැබිය යුතු ය;

(ii) කොමිෂන් සභාවේ සේවයෙන් ස්වේච්ඡාවෙන් ඉල්ලා අස්වීමට තීරණය කරනු ලබන සෑම නිලධරයකු ම සහ, සේවකයකු ම අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන්නා වූ ස්වේඡා සකසුරුවම් යෝජනා ක්‍රමයක් ප්‍රකාර ගෙවනු ලැබිය යුතු යම් වන්දි මුදලක් ගෙවනු ලැබීමට හිමිකම් ලැබිය යුතු අතර, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය ඇතුළුව යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ නිලධරයන්ට සහ සේවකයන්ට අදාළ විය හැකි විශ්‍රාම වැටුප් සහ වෙනත් විශ්‍රාම ප්‍රතිලාභවලට හිමිකම් ලැබිය යුතු ය.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 165 වැනි පිටුවේ 31 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''ලැබිය යුතු අතර, ඒවා කොමිෂන් සභාවේ විධානයට අනුව ආරම්භ''; සහ

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 166 වැනි පිටුවේ 3 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''තව ද, විමර්ශන පවත්වන අතරතුර කොමිෂන් සභාව වෙත සපයනු''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු නීතිඥ වන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 164 වැනි පිටුවේ 14 වැනි පේළියේ සිට 25 වැනි පේළිය දක්වා වූ පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

'' '1994 අංක 19 දරන පනත යටතේ පිහිටුවනු ලැබූ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් හෝ ඊට එරෙහිව පවරනු ලැබූ සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී ආරම්භ කරන ලද සියලු විමර්ශන හෝ අවසන් නොවී පවතින සියලු නඩු, නඩු පැවරීම්, විමර්ශන සහ වෙනත් නීති කෘත්‍ය, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් හෝ ඊට එරෙහිව පවරනු ලැබූ විමර්ශන, නඩු, නඩු පැවරීම් සහ වෙනත් නීති කෘත්‍ය ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ පවරනු ලැබ අඛණ්ඩව විනිශ්චයට ගනු ලැබූ විමර්ශන, නඩු, නඩු පැවරීම් සහ වෙනත් නීති කෘත්‍ය වූවාක් සේ නියමිත දිනට පසු අඛණ්ඩව විනිශ්චයට ගනු ලැබිය යුතුය' ''

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: ඉංග්‍රීසි භාෂා පිටපතෙහි 147 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 7 වැනි පේළිය දක්වා වූ පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

> " "proceedings instituted or investigations commenced by or against the Commission under this Act and shall be contiued after the appointed date as if they were inquiries, suits, actions, investigations and other legal proceedings instituted or investigations commenced and continued under this Act;'"

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

''වගන්තිය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

නව වගන්ති

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ නව සංශෝධනයක්: 166 වැනි පිටුවේ 24 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

> '165. ක්‍රියාත්මක වන දිනය නොසලකා, මෙම පනතේ විධිවිධාන ශ්‍රී ලංකාව විසින් දූෂණයට එරෙහිව එක්සත් ජාතීන්ගේ සම්මුතිය අපරානුමත කළ දින ක්‍රියාත්මක වන පරිදි අතීතයේ සිට බලපාන අයුරින් අදාළ විය යුතුය.' "

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 166 වැනි පිටුවේ 24 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> " 'මේ පනත යටතේ සිදුකරනු ලබන යම් වරදක් මගින් උපයාගත් මුදල් සහ අපරාධ කටයුතු මගින් උපයාගත් වෙනයම් මුදල් වේ නම් ඒවාද අයකර ගැනීමට අදාළ කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාව විමසමින් අමාත්‍යවරයා විසින් රෙගුලාසි සෑදිය යුතුය.' "

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

''වගන්තිය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

164 වැනි වගන්තිය සභා සම්මත විය.

'අ' උපලේඛනය

''උපලේඛනය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

'ආ' උපලේඛනය

''උපලේඛනය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පූර්විකාව

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: පූර්විකාව පහත පරිදි සංශෝධනය කිරීමට:—

පූර්විකාව : "දූෂණයට එරෙහි සහ වෙනත් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සම්මතයන්, ප්‍රමිති සහ ප්‍රශස්ත පරිචයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ නිශ්චිත විධිවිධාන බලාත්මක කිරීම සඳහා ද; වත්කම් සහ බැරකම් ප්‍රකාශවලට අදාළ අල්ලස්, දූෂණ සහ වැරදි පිළිබඳ චෝදනා සහ ආශ්‍රිත වැරදි අනාවරණය සහ විමර්ශනය කිරීමට සහ වත්කම් සහ බැරකම් ප්‍රකාශවලට අදාළ අල්ලස්, දූෂණ" යන වචන වෙනුවට "දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ ඇතැම් විධිවිධාන සහ වෙනත් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සම්මතයන්, ප්‍රමිති සහ ප්‍රශස්ත පරිචයන් බලාත්මක කිරීම සඳහා ද; වත්කම් සහ බැරකම් ප්‍රකාශවලට අදාළ වැරදි සහ අල්ලස්, දූෂණ පිළිබඳ චෝදනා සහ ආශ්‍රිත වැරදි අනාවරණය සහ විමර්ශනය කිරීමට සහ වත්කම් සහ බැරකම් ප්‍රකාශවලට අදාළ වැරදි, අල්ලස් දූෂණ" යන වචන ආදේශ කරන්න.

"පූර්විකාව සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

"ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වැනිවර කියවිය යුතු ය"යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව, සංශෝධිතාකරයෙන් තුන්වැනිවර කියවා සභා සම්මත කරන ලදී.

**5. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත:**

පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය" යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේ දී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 සිට 53 වගන්තිය දක්වා සභා සම්මත විය.

54 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 58 වැනි පිටුවේ 21 වැනි පේළියේ සිට 23 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "(2) ආරක්ෂක කොට්ඨාසයේ පොලිස් නිලධරයන්, පොලිස්පතිවරයා විසින් අධිකාරිය විමසා කරනු ලබන නාමයෝජනා මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව පත් කරනු ලැබිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 58 වැනි පිටුවේ 29 වැනි පේළියේ සිට 31 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයකුගේ නිලයට පහළ නොවන නිලයක උචිත සුදුසුකම් සහිත පොලිස් නිලධරයකු ආරක්ෂක කොට්ඨාසයේ ප්‍රධානියා ලෙස පත් කරනු ලැබිය යුතු අතර, ඔහු පොලිස්පතිවරයා විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ සහ නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ අධීක්ෂණය යටතේ කටයුතු කළ යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 59 වැනි පිටුවේ 3 වැනි පේළියේ සිට 7 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "ඔවුන් ඉවත් කිරීම සම්බන්ධ සියලු කාරණා පොලිස්පතිවරයාගේ නිර්දේශ මත, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව නිශ්චය කරනු ලැබිය යුතු ය. ඒ යම් කාරණයක් සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී පොලිස්පතිවරයා විසින් අධිකාරියේ අදහස් විමසිය හැකි ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

55 සිට 90 වගන්තිය දක්වා සභා සම්මත විය.

91 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 85 වැනි පිටුවේ 26 වැනි පේළියේ සිට 28 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "(අ) අපරාධයක වින්දිතයන්ට සිදු වූ යම් හිංසාවන් වෙනුවෙන් ගෙවනු ලබන වන්දි;";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

92 සිට 99 වගන්තිය දක්වා සභා සම්මත විය.

100 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 89 වැනි පිටුවේ 15 වැනි පේළියේ සිට 17 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

| | |
|---|---|
| "100. අධිකාරිය, 2023 අංක ....... දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය."; | අධිකාරිය, දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් විය යුතු |

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

101 සිට 103 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

104 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 93 වැනි පිටුවේ 23 වැනි පේළිය සහ 24 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ඇ) 2023 අංක .......... දරන දූෂණ විරෝධී පනත මඟින් පිහිටුවන"; සහ

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

105 වැනි වගන්තිය සභා සම්මත විය.

පළවන උපලේඛනය සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 104 වැනි පිටුවේ දෙවන උපලේඛනයේ 43 වැනි අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

| | | | |
|---|---|---|---|
| 44 | 2023 අංක ........ දරන දූෂණ විරෝධී පනත | 93 | ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ, මහාධිකරණවල විනිසුරුවන්, අධිකරණ නිලධරයන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා සම්බන්ධ අල්ලස් |
| 45 | | 94 | රජයේ සේවකයන්ගේ සම්මුඛ පරීක්ෂණයක් සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් තුටු පඬුරු පිළිගැනීම |
| 46 | | 96 | පොලිස් නිලධරයන්, සාම නිලධරයන් සහ වෙනත් රජයේ සේවකයන් අල්ලස් ගැනීම |
| 47 | | 97 | ගිවිසුම්වලට අදාළව සහාය ලබා දීමට හෝ බලපෑමක් සිදු කිරීම සඳහා වූ අල්ලස් |
| 48 | | 98 | ටෙන්ඩර් ඉල්ලා අස්කර ගැනීම සඳහා වූ අල්ලස් |
| 49 | | 99 | රජයේ කටයුතු සම්බන්ධයෙන් වූ අල්ලස් |
| 50 | | 100 | හිමිකම් පෑම, ගෙවීම්, පත් කිරීම්, රැකියා, ප්‍රදාන, බදුකර සහ වෙනත් ප්‍රතිලාභ සම්බන්ධයෙන් වූ අල්ලස් |
| 51 | | 101 | රජය සමඟ සම්බන්ධතාවක් දක්වන තැනැත්තන් විසින් රජයේ සේවකයන්ට අල්ලස් දීම |
| 52 | | 102 | පළාත් පාලන ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක පාලන මණ්ඩලයක සාමාජිකයකු හා සම්බන්ධ අල්ලස් සහ පළාත් පාලන ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක නිලධරයකු හා සම්බන්ධ අල්ලස් |

| | | | |
|---|---|---|---|
| 53 | | 103 | පළාත් පාලන ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක පාලක මණ්ඩලයක සාමාජිකයකුගේ ඡන්දයට බලපෑම් කිරීම සඳහා තර්ජන සහ වංචාව යොදා ගැනීම |
| 54 | | 104 | වෙළඳාමේ දී බලපෑම් කිරීම. |
| 55 | | 108 | ක්‍රීඩා ඉසව්වලට අදාළ වැරදි |
| 56 | | 111 | දූෂණ |
| 57 | | 125 | යුක්තියට බාධා කිරීම |
| 58 | **(218 වන අධිකාරය වූ) විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග ආඥාපනත** | 54අ | අන්තරායදායක ඖෂධ වර්ග නිෂ්පාදනය කිරීම, ජාවාරම් කිරීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම හා සන්තකයේ තබා ගැනීම |
| 59 | | 54 ආ | 54අ වන වගන්තිය යටතේ වූ වරදක් සිදු කිරීමට අනුබල දීම හෝ ඒ වරද සිදු කිරීමට තැත් කිරීම |
| 60 | 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත | 2 | නිශ්චිත තැනැත්තකුගේ හෝ සාක්ෂිකරුවකුගේ මරණය සිදු කිරීම ආදිය, සාපරාධී භයගැන්වීම, රජයේ දේපළකට අනර්ථය සිදු කිරීම ආදිය |
| 61 | | 3 | පනත යටතේ වූ වරදක් කිරීමට අනුබල දීම, කුමන්ත්‍රණය කිරීම, තැත් කිරීම හෝ පෙළඹවීම |

| | | | |
|---|---|---|---|
| 62 | | 12 | පනතේ 11 වන වගන්තිය යටතේ කරන ලද තහනම් කිරීමේ හෝ සීමා කිරීමේ නියමයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම |
| 63 | | 24 | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ යාත්‍රාවක් හෝ ගුවන් යානයක් සම්බන්ධයෙන් පනත යටතේ වරදක් සංස්ථාපනය වන ක්‍රියාවක් සිදු කිරීම |

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

'' උපලේඛනය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

''ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

''පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වැනිවර කියවිය යුතු ය''යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව, සංශෝධිතාකරයෙන් තුන්වැනිවර කියවා සභා සම්මත කරන ලදී.

**6.** **හදට හද භාරකාර අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත**: දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

''පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය''යි අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 53(3) යටතේ කථානායකවරයා විසින් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරන ලදී.

**7.** **කල් තැබීම**: ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය''යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 1.51ට කථානායකවරයා විසින් පාර්ලිමේන්තුව 2023 ජුලි 20 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වනතෙක් කල් තබන ලදී.